# ඇබෑර්තු

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

## ලංකා සතොස ලිමිටඩ්හි අරමුණ

ශ්‍රී ලංකාවේ රජය සතු විශාලතම සිල්ලර වෙළඳ ව්‍යාපාරය ලෙස, දිවයින පුරා සිටින ජනතාවගේ දෛනික ජීවිතය යහපත් කරමින්, ගුණාත්මක නිෂ්පාදන සහතදයී මිල ගණන් යටතේ ලබා දීමට අප කැපවී සිටිමු. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට (SMEs) ඔවුන්ගේ ව්‍යාපාර වර්ධනය කර ගැනීම සඳහා විශ්වාසදයක සහ කරදරයකින් තොර වේදිකාවක් සපයන අතරම, අවම බාධක මධ්‍යයේ ගොවීන් සහ වෙළඳුන් අතර ශක්තිමත් සහ සෘජු සබඳතා ගොඩනැගීමට අප ආඩම්බරයෙන් සහාය වෙමු. අඛණ්ඩතාව, විනිවිදභාවය සහ ගෞරවය පෙරදැරි කර ගනිමින්, අපගේ සේවකයින්ට සහ සියලුම පාර්ශවකරුවන්ට එක්ව වර්ධනය වීමට සහ සාර්ථක වීමට ශක්තියක් ලබා දෙන ගතික සහ සහයෝගී සංස්කෘතියක් අප පෝෂණය කරමු.

ප්‍රජාවන්ට සේවය කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය වීම සහ ශ්‍රී ලංකාව පුරා වර්ධනයක් ඇති කිරීම යන අපගේ මෙහෙවරට දායක වීම සඳහා ඉහත සඳහන් කළ තනතුර සඳහා ලංකා සතොස ලිමිටඩ් ආයතනය සමග සම්බන්ධ වීමට දක්ෂ පුද්ගලයින් අප සොයමින් සිටිමු

## 1. ප්‍රධාන විධායක නිලධාරී

**රැකියා විස්තරය**

- ලංකා සතොස ලිමිටඩ් තිරසාර වර්ධනයක් සහ මෙහෙයුම් විශිෂ්ටත්වයක් කරා මෙහෙයවීම සඳහා දූරදර්ශී නායකත්වයක් සහ උපායමාර්ගික මගපෙන්වීමක් ලබා දීම.
- ආයතනයේ සිල්ලර වෙළඳ ජාලයේ සමස්ත කළමනාකරණය සහ පරිපාලනය අධීක්ෂණය කිරීම.
- ආයතනයේ මෙහෙවර සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපාරික සැලසුම්, ප්‍රතිපත්ති සහ මෙහෙයුම් රාමු සැකසීම, ක්‍රියාත්මක කිරීම සහ නිරීක්ෂණය කිරීම.
- ඵලදායී මූල්‍ය කළමනාකරණය, පිරිවැය පාලනය සහ ආදායම් වර්ධන උපාය මාර්ග හරහා ආයතනික කාර්ය සාධනය ඉහළ නැංවීම.
- සේවක නියැලීම, හැකියාවන් සංවර්ධනය සහ ආරක්ෂිත, ඵලදායී වැඩ පරිසරයක් සහතික කරමින් උසස් කාර්ය සාධන සංස්කෘතියක් පෝෂණය කිරීම.
- රාජ්‍ය පාර්ශවකරුවන්, නියාමන ආයතන, සැපයුම්කරුවන් සහ පුළුල් ප්‍රජාව සමග ශක්තිමත් සබඳතා ගොඩනැගීම සහ පවත්වාගෙන යාම.
- රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත අවශ්‍යතා, පාලන ප්‍රමිති සහ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහතික කිරීම.
- පාරිභෝගික තෘප්තිය සහ වෙළඳපල තරගකාරිත්වය ඉහළ නැංවීම සඳහා ව්‍යාප්තිය, නවීකරණය සහ සේවා වැඩිදියුණු කිරීම සඳහා වන අවස්ථා හඳුනා ගැනීම.
- සිල්ලර මෙහෙයුම්, සැපයුම් දාමය සහ පාරිභෝගික සේවය යන අංශවල ආයතනික වෙනස් කිරීමේ මූලපිරීම් මෙහෙයවීම සහ හොඳම භාවිතයන් ක්‍රියාත්මක කිරීම.
- කාලීන අවබෝධයක් සහ නිර්දේශ ලබා දෙමින් සංවිධානයේ කාර්ය සාධනය, මූල්‍ය සෞඛ්‍යය සහ උපායමාර්ගික මගපෙන්වීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

**සුදුසුකම්**

**අභ්‍යන්තර සහ බාහිර අපේක්ෂකයින් සඳහා: (පහත 1 හෝ 2):**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් හෝ කළමනාකරණය / ගණකාධිකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අධි සාමාජිකත්වය.

   **සහ**

   ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 20 ට නොඅඩු පළපුරුද්දක් හා ඉන් වසර 05 ක පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය (PhD) උපාධියක්.

   **සහ**

   ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ට නොඅඩු පළපුරුද්දක් හා ඉන් වසර 05 ක පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**වයස:** අවුරුදු 45 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් සහ වෙනත් දීමනා:** මූලික වැටුප: 250,000.00, ජීවන වියදම් දීමනාව: 50,000.00, **වෘත්තීය දීමනාව:** 100,000.00, කාර්ය සාධන දීමනාව: 150,000.00, සන්නිවේදන දීමනාව: 4,250.00 සහ ඉන්ධන (ලීටර් 145) සමඟ ආයතනයේ නිල රථයක් සපයනු ලැබේ.

**පත්වීමේ ස්වභාවය :** මූලික වැටුපට සහ ජීවන වියදම් දීමනාවට EPF සහ ETF සඳහා හිමිකම් සහිතව, වාර්ෂික අලුත් කිරීමට යටත්ව වසර පහක (05) කොන්ත්‍රාත් පදනම.

## 2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන

**රැකියා විස්තරය**

- ආයතනික අරමුණු සහ අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- කාර්යක්ෂමතාවය සහ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ක්‍රියාවලීන්හි ස්වාධීන විගණන සහ සමාලෝචන පැවැත්වීම.
- අවදානම්, පාලන දුර්වලතා සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ ක්ෂේත්‍රය හඳුනා ගනිමින් කළමනාකාරිත්වයට ප්‍රායෝගික නිර්දේශ ලබා දීම.
- පුළුල් අභ්‍යන්තර විගණන වාර්තා සකස් කිරීම අධීක්ෂණය කිරීම සහ විගණන කමිටුවට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සොයාගැනීම් ඉදිරිපත් කිරීම.
- විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ අදාළ දෙපාර්තමේන්තු විසින් ගනු ලබන නිවැරදි කිරීමේ පියවර පිළිබඳව පසු විපරම් කිරීම.
- ක්‍රමවත් සහ විනිවිදභාවයෙන් යුත් විගණන ක්‍රියාවලීන් හරහා අදාළ නීති, රෙගුලාසි සහ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහතික කිරීම.
- උසස් වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගැනීමට සහ ආයතනික පාලනය ඉහළ නැංවීම සඳහා අභ්‍යන්තර විගණන කණ්ඩායම මෙහෙයවීම, උපදෙස් දීම සහ කළමනාකරණය කිරීම.

**සුදුසුකම්**

**අභ්‍යන්තර සහ බාහිර අපේක්ෂකයින් සඳහා: (පහත 1 හෝ 2):**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය / මූල්‍ය කළමනාකරණය / ආර්ථික විද්‍යාව / වාණිජ්‍ය පිළිබඳ උපාධියක් සමඟින් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (Masters Degree) සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ට නොඅඩු පළපුරුද්දක් හා ඉන් වසර 05 ක පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.
2. තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය "වරලත් ආයතනයක" (CIMA, ACCA, CA, CIA) අධි සාමාජිකත්වය (Fellow Membership) සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ට නොඅඩු පළපුරුද්දක් හා ඉන් වසර 05 ක පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**වයස:** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් සහ වෙනත් දීමනා:** මූලික වැටුප: 150,000.00, ජීවන වියදම් දීමනාව: 25,000.00, **වෘත්තීය දීමනාව:** 75,000.00, කාර්ය සාධන දීමනාව: 100,000.00, ප්‍රවාහන දීමනාව: 100,000, සන්නිවේදන දීමනාව: 3,750.00 සහ මසකට ලීටර් 135 ක ඉන්ධන දීමනාවකට හිමිකම් ලබයි.

**පත්වීමේ ස්වභාවය:** EPF සහ ETF සඳහා හිමිකම් සහිතව, වාර්ෂික අලුත් කිරීමට යටත්ව වසර පහක (05) කොන්ත්‍රාත් පදනම.

## 3. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ

**රැකියා විස්තරය**

- පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීම, සම්බන්ධ කර ගැනීම සහ තිරසාර ආදායම් වර්ධනයක් ඇති කිරීම සඳහා ලංකා සතොස ලිමිටඩ් හි ව්‍යාපාරික අරමුණු සමග සම්පූර්ණයෙන්ම අනුකූල වන පරිදි සමස්ත අලෙවිකරණ උපාය මාර්ග සහ පුළුල් අලෙවිකරණ සැලසුම් සැකසීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ලංකා සතොස ලිමිටඩ් හි වෙළඳපල පැවැත්ම ශක්තිමත් කිරීමට, සන්නාම දැනුවත්භාවය වැඩි කිරීමට සහ සියලුම නාලිකා ඔස්සේ ස්ථාවර පණිවිඩ හුවමාරුවක් සහතික කිරීම සඳහා බලපෑම්කාරී සන්නාම උපාය මාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ආයතනික ප්‍රමුඛතාවලට ඵලදායී ලෙස සහාය වන සහ සමස්ත කාර්ය සාධනය ඉහළ නංවන ඒකාබද්ධ අලෙවිකරණ මූලපිරීම් සහතික කිරීම සඳහා විකුණුම්, නිෂ්පාදන සහ අනෙකුත් ප්‍රධාන දෙපාර්තමේන්තු සමග සමීපව සහයෝගයෙන් කටයුතු කිරීම.
- ව්‍යාපාර සහ ව්‍යාපෘති හරහා සම්පත් ප්‍රශස්ත ලෙස වෙන් කිරීම, පිරිවැය කාර්යක්ෂමතාව සහ උපරිම ආයෝජන ප්‍රතිලාභ සහතික කිරීම සඳහා අලෙවිකරණ අයවැය සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- අලෙවිකරණ සඵලතාවය ඇගයීමට, උපාය මාර්ග වැඩිදියුණු කිරීමට සහ දැනුවත්, ප්‍රතිඵල කේන්ද්‍රීය තීරණ ගැනීමට වෙළඳපල පර්යේෂණ, විශ්ලේෂණ සහ කාර්ය සාධන දර්ශක උපයෝගී කර ගැනීම.
- අලෙවිකරණ කාර්ය සාධනය, ප්‍රධාන මූලපිරීම් සහ වර්ධන අවස්ථා පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සවිස්තරාත්මක වාර්තා, උපායමාර්ගික අවබෝධයන් සහ ප්‍රායෝගික නිර්දේශ ලබා දීම.
- ප්‍රතිඵල කේන්ද්‍රීය සහ නව්‍ය වැඩ සංස්කෘතියක් පෝෂණය කරමින් අලෙවිකරණ කණ්ඩායමට නායකත්වය සහ මගපෙන්වීම ලබා දීම.

**සුදුසුකම්**

**බාහිර සහ අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා: (පහත 1 හෝ 2):**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණ කළමනාකරණය / ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් සමඟින් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (Masters Degree) සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ට නොඅඩු පළපුරුද්දක් හා ඉන් වසර 05 ක පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.
2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය " වරලත් ආයතනයක" (SLIM, CIM) අධි සාමාජිකත්වය (Fellow Membership) සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ට නොඅඩු පළපුරුද්දක් හා ඉන් වසර 05 ක පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් සහ වෙනත් දීමනා:** මූලික වැටුප: 150,000.00, ජීවන වියදම් දීමනාව: 25,000.00, **වෘත්තීය දීමනාව:** 75,000.00, කාර්ය සාධන දීමනාව: 100,000.00, ප්‍රවාහන දීමනාව: 100,000, සන්නිවේදන දීමනාව: 3,750.00 සහ මසකට ලීටර් 135 ක ඉන්ධන දීමනාවකට හිමිකම් ලබයි.

**පත්වීමේ ස්වභාවය :** EPF සහ ETF සඳහා හිමිකම් සහිතව, වාර්ෂික අලුත් කිරීමට යටත්ව වසර පහක (05) කොන්ත්‍රාත් පදනම.

## 4. ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නීති

**රැකියා විස්තරය**

- දැනුවත් තීරණ ගැනීමට සහාය වීම සඳහා මෙහෙයුම්, ගිවිසුම්ගත, නියාමන සහ පාලන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට විශේෂඥ නීති උපදෙස් ලබා දීම.
- සමාගම් නීතිය, කම්කරු නීතිය, රාජ්‍ය ප්‍රසම්පාදන, පාරිභෝගික ආරක්ෂණ සහ රජයේ රෙගුලාසි ඇතුළු අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම.
- නීත්‍යානුකූල භාවය සහ අවදානම් අවම කිරීම සහතික කරමින් සැපයුම් ගිවිසුම්, සේවා ගිවිසුම්, බදු බදු දීම් (leases) සහ අවබෝධතා ගිවිසුම් (MOUs) වැනි විවිධ නීතිමය ගිවිසුම් සකස් කිරීම, සමාලෝචනය කිරීම සහ සාකච්ඡා කිරීම.
- අභ්‍යන්තර පාර්ශවකරුවන් සහ බාහිර නීතිඥයින් සමඟ සම්බන්ධීකරණය වෙමින් උසාවි කටයුතු කළමනාකරණය කරමින් සියලුම නඩු පැවරීම් සහ නීතිමය ආරවුල් හැසිරවීම.
- කම්කරු නීති සහ ආයතනික රාමු වලට අනුකූලව විෂමාචාර, වංචා සහ සේවක විනය නඩු වලට අදාළ නීතිමය සමාලෝචන පැවැත්වීම සහ අභ්‍යන්තර පරීක්ෂණ සඳහා සහාය වීම.
- මෙහෙයුම් පුරා ඇති විය හැකි නීතිමය අවදානම් හඳුනා ගැනීම සහ වැළැක්වීමේ පියවර නිර්දේශ කිරීම, එමෙන්ම නීතිමය ප්‍රතිපත්ති, SOPs සහ අභ්‍යන්තර පාලනයන් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම.
- දේපල බදු දීම්, ඉඩම් හිමිකම සහ වත්කම් ලේඛනගත කිරීම සම්බන්ධ නීතිමය කටයුතු අධීක්ෂණය කිරීම, එමෙන්ම සමාගමේ බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම සහ ලියාපදිංචි කිරීම සහතික කිරීම.
- ලංකා සතොස ලිමිටඩ්හි නීති අංශයට නායකත්වය දීම සහ නියාමන ආයතන, විගණකවරුන්, අමාත්‍යාංශ සහ නීතිය බලාත්මක කිරීමේ ආයතන සමග නීතිමය සම්බන්ධතා ස්ථානය ලෙස කටයුතු කිරීම සහ කාලීන නීතිමය වාර්තාකරණය සහ ලේඛන ඉදිරිපත් කිරීම සහතික කිරීම.

**සුදුසුකම්**

**බාහිර අපේක්ෂකයින්: (පහත 1):**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (Masters Degree) සහිත නීතිඥයෙකු වීම සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත I හෝ II):**

i. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
ii. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ ගණයට (MM) අයත් I ශ්‍රේණියේ තනතුරක වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස:** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය සහ පරිමාණය:** (වැටුප් කේතය HM 1-1-2025 සහ වැටුප් පරිමාණය රු.140,640/= - 15 X රු.4,100/= - රු.202,140/=).

**වැටුප් සහ වෙනත් දීමනා 2026:** මූලික වැටුප: 123,019.00, ජීවන වියදම් දීමනාව: 17,800.00, වෘත්තීය දීමනාව: 25,000.00, ප්‍රවාහන දීමනාව: 50,000.00, සන්නිවේදන දීමනාව: 2,000.00 සහ මසකට ලීටර් 115 ක ඉන්ධන දීමනාවකට හිමිකම් ලබයි.

**පත්වීමේ ස්වභාවය:** EPF සහ ETF සඳහා හිමිකම් සහිත ස්ථිර පදනම.

## 5. ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ප්‍රසම්පාදන

**රැකියා විස්තරය**

- ලංකා සතොස ලිමිටඩ් හි සියලුම අලෙවිසැල් පුරා අවශ්‍ය භාණ්ඩ හා සේවා කාර්යක්ෂම, පිරිවැය-ඵලදායී සහ නියමිත කලට අත්පත් කර ගැනීම සහතික කිරීම සඳහා උපායමාර්ගික ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ කාණ්ඩ-විශේෂිත මූලාශ්‍ර සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- ගුණාත්මකභාවය, බෙදා හැරීම සහ අනුකූලතා ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා ඔවුන්ගේ කාර්ය සාධනය නිරීක්ෂණය කරන අතරම විශ්වාසදායක සැපයුම්කරුවන් සමග ශක්තිමත් හවුල්කාරිත්වයන් ඇති කිරීම, සාකච්ඡා කිරීම සහ පවත්වාගෙන යාම.
- රජයේ ප්‍රසම්පාදන රෙගුලාසිවලට අනුකූලව ටෙන්ඩර්, ලංසු ඇගයීම්, කොන්ත්‍රාත් සාකච්ඡා සහ ලේඛනගත කිරීම් කළමනාකරණය කිරීම මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය, තරගකාරිත්වය සහ අනුකූලතාවය සහතික කිරීම.
- ඉල්ලුම නිවැරදිව පුරෝකථනය කිරීමට සහ අඛණ්ඩ තොග පවතින බව සහතික කිරීමට ප්‍රසම්පාදන නිලධාරීන්, ගබඩා කාර්ය මණ්ඩලය සහ අලෙවිසැල් කණ්ඩායම් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, එමෙන්ම අධික ලෙස තොග රැස්වීම සහ තොග හිඟවීම යන දෙකම ඵලදායී ලෙස අවම කිරීම.
- වාර්ෂික ප්‍රසම්පාදන අයවැය සකස් කිරීම, වියදම් අධීක්ෂණය කිරීම සහ උපායමාර්ගික මූලාශ්‍ර, වෙළඳපල විශ්ලේෂණය සහ සැපයුම්කරුවන් ඒකාබද්ධ කිරීම හරහා පිරිවැය ඉතිරි කිරීමේ මූලපිරීම් මෙහෙයවීම.
- සියලුම අදියරයන්හිදී සදාචාරාත්මක ප්‍රසම්පාදන භාවිතයන් ආරක්ෂා වන බව සහතික කරන අතරම, රාජ්‍ය මූල්‍ය රෙගුලාසි, අභ්‍යන්තර පාලනයන් සහ විගණන අවශ්‍යතා දැඩි ලෙස පිළිපැදීම පවත්වා ගැනීම.
- ප්‍රසම්පාදන කණ්ඩායමට නායකත්වය සහ මගපෙන්වීම ලබා දීම, කාර්ය සාධන ඇගයීම් පැවැත්වීම සහ ප්‍රසම්පාදන හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**සුදුසුකම්**

**බාහිර අපේක්ෂකයින්: (පහත 1 හෝ 2):**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය / ව්‍යාපාර කළමනාකරණය / වාණිජ්‍ය / සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය / විද්‍යාව / මිලදී ගැනීම් සහ ද්‍රව්‍ය කළමනාකරණය / ජාත්‍යන්තර වෙළඳාම / ව්‍යාපාර පරිපාලනය / සැපයුම් සේවා කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් සමඟින් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (Masters Degree) සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.
2. තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත I හෝ II) :**

i. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
ii. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ ගණයට (MM) අයත් I ශ්‍රේණියේ තනතුරක වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය සහ පරිමාණය:** (වැටුප් කේතය HM 1-1-2025 සහ වැටුප් පරිමාණය රු.140,640/= - 15 X රු.4,100/= - රු.202,140/=).

**වැටුප් සහ වෙනත් දීමනා 2026:** මූලික වැටුප: 123,019.00 ජීවන වියදම් දීමනාව: 17,800.00, වෘත්තීය දීමනාව: 25,000.00, ප්‍රවාහන දීමනාව: 50,000.00, සන්නිවේදන දීමනාව: 2,000.00 සහ මසකට ලීටර් 115 ක ඉන්ධන දීමනාවකට හිමිකම් ලබයි.

**පත්වීමේ ස්වභාවය:** EPF සහ ETF සඳහා හිමිකම් සහිත ස්ථිර පදනම.

**සියලුම අපේක්ෂකයින් සඳහා අදාළ වන පොදු සුදුසුකම් :**

- පිළිගත් වාණිජ හෝ බහුජාතික සංවිධානයක සමාන තනතුරක පළපුරුද්ද තිබීම.
- රාජ්‍ය ආයතනයක පළපුරුද්ද තිබීම අනිවාර්ය අමතර වාසියක් වනු ඇත.
- විශිෂ්ට විශ්ලේෂණාත්මක, ගැටළු විසඳීමේ සහ සංවිධානාත්මක කුසලතා තිබීම.
- ශක්තිමත් නායකත්ව ගුණාංග සහ අන්තර් පුද්ගල සන්නිවේදන කුසලතා සතු වීම.
- තොරතුරු තාක්ෂණ (ICT) කුසලතාව තිබීම.
- විවිධ විෂය පථයන්ට අයත් කණ්ඩායම් මෙහෙයවීමට සහ උපදෙස් දීමට ඇති හැකියාව.

**සෑම අයදුම්කරුවෙකුම:**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට ශාරීරිකව සහ මානසිකව නිරෝගී විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද සහ නිපුණතා සපුරා ඇති අපේක්ෂකයින්ට ඔවුන්ගේ ජීව දත්ත පත්‍රිකාව (CV) අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් 2026 ජූනි 27 දිනට හෝ ඊට පෙර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පරිපාලන, ලංකා සතොස ලිමිටඩ්, නො 27, සතොස මහලේකම් ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 යන ලිපිනයට හෝ vacancies@lankasathosa.org වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කළ යුතුය.

**සභාපති,**
**ලංකා සතොස ලිමිටඩ්,**
**අංක 27, සතොස මහලේකම් ගොඩනැගිල්ල,**
**වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**